# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 12,771 — 1961 නොවැම්බර් 13 වැනි සඳුද — 13.11.1961**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**නිරෝධායන හා රෝග නිවාරණ ආඥාපනත**

1925 අගෝස්තු මස 28 වැනි දින හා අංක 7,481 දරන ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළ කරන ලද්ද වූත්, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින, අංක 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි, ලිහිල් කර පළ කරන ලද්ද වූත්, නිරෝධායන හා රෝග නිවාරණ ආඥාපනතේ (173 පරිච්ඡේදය) 2 වැනි හා 3 වැනි ඡේදවලින් දක්වෙන රෙකුලාසි යටතේ 1 වැනි රෙකුලාසිය මගින් මා වෙත පැවරෙන බලතල අනුව, 1961 ඔක්තෝබර් මස 16 වැනි දින සහ 1961 ඔක්තෝබර් මස 17 වැනි දින කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරී විසින් '' රෝග ග්‍රස්ත ප්‍රදේශයක් '' වශයෙන් දක්වා කරන ලද ප්‍රකාශයන් ස්ථිර කරමින්, ඔක්තෝබර් මස 20 වැනි දින හා අංක 12,726 දරන ගැසට් පත්‍රයෙහිත්, 1961 ඔක්තෝබර් 24 වැනි දින හා අංක 12,730 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහිත් පළ කරනු ලැබූ නිවේදනයත් සෞඛ්‍ය ඇමති, ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, 1961 නොවැම්බර් මස 8 වැනි දින සිට අවලංගු කරමි.

**ඒ. පී. ජයසූරිය,**
**සෞඛ්‍ය ඇමති.**

1961 නොවැම්බර් මස 10 දින,
කොළඹ දීය.

11–623.

---

### මිල පාලන දැන්වීම්

**ඇෆ් සී/වී.—ඇස්. ඇෆ් 1 (38) අංකය දරණ මිල නියෝගය**

**අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක කැන්පත් ආතර් කත්බර්ට් බර්තොලමියුස් වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1961 ජුනි 20 වෙනි දින හා අංක 12,493 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1961 ජුනි මස 12 වැනි දින හා අංක ඇෆ්සී/වී—ඇස්.ඇෆ් 1(37) දරණ මාගේ ආහාර මිල නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

(2) 1950 අංක 29 දරණ මිල පාලන පනත යටතේ සකස්වූ කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දනට විකිණිය හැකි උපරිම තොග මිල ගණනට මෙයට යාකර ඇති උපලේඛනයේ 2 සිට 11 වැනි තීරයෙහි සඳහන් මිල ගණන් එකතු කිරීමේන් එම උප ලේඛනයෙහි පළමුවැනි තීරයෙහි විස්තර කරන ලද ද්‍රව්‍ය දළබර හොණ්ඩරයක් අනුපිළිවෙලින් උපලේඛනයේ 2 වැනි, 3 වැනි, 4 වැනි, 5 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි, 9 වැනි 10 වැනි සහ 11 වැනි තීරයන්හි සඳහන් ප්‍රදේශවල තොග වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිල ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) 1950 අංක 29 දරණ මිළ පාලන පනත යටතේ සකස්වූ කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් දැනට විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ගණනට, මෙයට යාකර ඇති උපලේඛනයේ 12 වැනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ පළමු වැනි තීරයේ විස්තර කරන ලද ද්‍රව්‍ය ශුද්ධ බර රාත්තලක් කොළඹ පාලන දිස්ත්‍රික්කයෙහි (කොළඹ නාගරික සීමාවෙන් පිට) සිල්ලර වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්;

(ආ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්;

මෙම නියෝගයෙන් නියම කරමි.

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍යය සඳහා නියම කරන ලද වැඩිම මිළ ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෝ "රා." යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම, මිළයට ගන්නා, ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව නියම කරමි.

(9) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට, ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිළත් උප ලේඛනයේ 2 සිට 12 දක්වා දරණ තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1961 නොවැම්බර් 8 වැනි දින, ප.ව. 2.30 ට කොළඹ කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඒ. සී. බර්තොලමියුස්,
(ආහාර) සහකාර මිළ පාලක,
කොළඹ දිස්ත්‍රික්කය.

[උපලෙඛනය සඳහා 2077 පිට බලන්න.]

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය හාපිටිගම් කෝරලය | 3 වැනි තීරය අලුත්කුරු කෝරලය උතුර " ඒ " | 4 වැනි තීරය අලුත්කුරු කෝරලය උතුර " බී " | 5 වැනි තීරය අලුත්කුරු කෝරලය දකුණ | 6 වැනි තීරය සියනෑ කෝරලය නැගෙනහිර | 7 වැනි තීරය සියනෑ කෝරලය බටහිර (අධිකාරි පත්තුව) | 8 වැනි තීරය සියනෑ කෝරලය බටහිර (මැද පත්තුව) | 9 වැනි තීරය හේවාගම් කෝරලය | 10 වැනි තීරය සල්පිටි කෝරලය | 11 වැනි තීරය කොළඹ ආදායම් පාලක නිළධාරි තැනගේ කොට්ඨාශය (කොළඹ නාගරික සීමා වෙන් පිට) | 12 වැනි තීරය සිල්ලර වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නාගරික සීමා වෙන් පිට) ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | | | | | | | | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
| | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් ගෙන තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරටය වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොගවෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් රාත්තලක් සිල්ලරට කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ළූනු (රතු ළූනු සහ චික්බෙල්පූර් හැර වෙනත් සියලුම) ... ... | 2 0 | 1 76 | 1 78 | 1 50 | 1 80 | 1 48 | 1 64 | 1 62 | 1 54 | 1 44 | 0 02 |
| අර්තාපල් ... ... | 2 0 | 1 76 | 1 78 | 1 50 | 1 80 | 1 48 | 1 64 | 1 62 | 1 54 | 1 44 | 0 02 |
| අර්තාපල් (ඉන්දියානු) මෙට්ටුපාලයම් ... | 2 0 | 1 76 | 1 78 | 1 50 | 1 80 | 1 48 | 1 64 | 1 62 | 1 54 | 1 44 | 0 02 |
| වියළි මිරිස්, සන්නම් i වෙනි ශ්‍රෙණිය ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| එම එම ii වෙනි ශ්‍රෙණිය ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| එම මුණ්ඩු i වෙනි ශ්‍රෙණිය ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| එම එම ii වෙනි ශ්‍රෙණිය ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| එම සන්ටක ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| එම ජාවා ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| සූදුරු ... ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| කහ ... ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| කොත්තමල්ලි ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| පියළි නොකළ උලුඳු ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| මුං ඇට ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| තෝර පරිප්පු ... ... | 2 0 | 1 76 | 1 78 | 1 50 | 1 80 | 1 48 | 1 64 | 1 62 | 1 54 | 1 44 | 0 02 |
| කඩල පරිප්පු ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| චික්පීස් ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| සුදුළූනු (බෙ මිබෙ) ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |
| සියඹලා ... ... | 3 0 | 2 76 | 2 78 | 2 50 | 2 80 | 2 48 | 2 64 | 2 62 | 2 54 | 2 44 | 0 03 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

11 540